පේරාදෙණිය විශ්වවිද්‍යාලය
UNIVERSITY OF PERADENIYA
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

කළමනාකරණ හා සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව 2018-2019

**DM 023** - කළමණාකරුවන් සඳහා ගිණුම්කරණය

උපදෙස්: **01 හා 02 ප්‍රශ්ණ සහ තවත් ප්‍රශ්ණ 03 ක්ද ඇතුළුව ප්‍රශ්ණ පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**
ගණක යන්ත්‍ර භාවිතා කළ හැක.

මුළු ලකුණු 100 — කාලය: පැය 03.

**දිනය:** **වේලාව:**

**ප්‍රශ්ණ අංක 01.**

2018.03.31 දිනෙන් අවසන් වසර සඳහා සහරා ග්‍රොසරිහි ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | රු. | රු. |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 2,500,000 |
| 10% බැංකු ණය | | 200,000 |
| ඉඩම් සහ ගොඩනැගිලි (පිරිවැය) | 600,000 | |
| කාරයාල උපකරණ (පිරිවැය) | 200,000 | |
| මෝටර් රථ (පිරිවැය) | 800,000 | |
| 2017.04.01 දිනට ක්ෂය වෙන්කිරීම් | | |
| ඉඩම් සහ ගොඩනැගිලි | | 30,000 |
| කාර් යාල උපකරණ | | 24,000 |
| මෝටර් රථ | | 160,000 |
| බැංකු ණය පොලි | 12,000 | |
| 2017 අප්‍රේල් 01 දිනට තොගය | 600,000 | |
| කළමනාකරුගේ වැටුප් | 300,000 | |
| වරිපනම් බදු සහ කුලී | 40,000 | |
| විදුලිය | 80,000 | |
| ප්‍රචාරණය | 250,000 | |
| ජල බිල්පත් | 30,000 | |
| වැටුප් සහ වේතන | 620,000 | |
| දුරකථන ගාස්තු | 48,000 | |
| විකුණුම් සහ බෙදාහැරීමේ වියදම් | 200,000 | |
| පවත්වාගැනීමේ වියදම් | 100,000 | |
| 2017 .04.01 දිනට අඩමාන ණය සඳහා වන දීමනාව | | 20,000 |
| වෙළෙඳ ලැබීයයුතු දෑ | 80,000 | |
| වෙළෙඳ ගෙවියයුතු දෑ | | 40,000 |
| විකුණුම් | | 4,000,000 |
| අතැති මුදල් | 1,180,000 | |

| | | |
|---|---|---|
| ගැණුම් | 1,800,000 | |
| බොල්ණය | 34,000 | |
| | **6,974,000** | **6,974,000** |

**අතිරේක තොරතුරු:**

(අ). 2018.03.31 දිනට තොගය රු. 800,000 කි.

(ආ). වසර සඳහා මුළු බොල්ණය ලෙස රු. 64,000 ක් කපාහල යුතුය.

(ඇ). අඩමාන ණය සඳහා වෙන්කිරීම ඉතිරි ණයගැතියන්ගෙන් 10% ක් ලෙස ගැලපිය යුතුය.

(ඈ). ජංගම නොවන වත්කම් පහත පරිදි ක්ෂය කරනු ලැබේ.

ඉඩම් සහ ගොඩනැගිලි 5%
කාර් යාල උපකරණ 12%
මෝටර් රථ 20%

(ඉ). ඉදිරියට කල ප්‍රචාරණ වියදම් ගෙවීම් රු. 50,000 කි.

(ඊ). වසර සඳහා වන උපචිත දුරකථන ගාස්තු රු. 5,000 ක් ද උපචිත විදුලිය රු. 8,000 ක්ද උපචිත ජල බිල්පත් රු. 2,000 ක්ද විය.

**ඔබ විසින්:**

**(i).** 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය.

(ii). 2018 03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙළ කරන්න.

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්ණ අංක 02**

සංගක්කාර මහතා විසින් 2020 ජනවාරි මස 01 වන දින සිට තමන්ගේම තනි ව්‍යාපාරයක් ලෙස රෙදිපිළි වෙළෙඳසැලක් ආරම්භ කිරීමට අදහස් කර ගෙන සිටී. ඒ සඳහා ඔහු විසින් රු. 1,500,000 ක මූලික ප්‍රාග්ධනයක් යෙදවීමට අපේක්ෂා කරයි. ඒ අනුව ඉදිරි සැලැස්මක් ලෙස 2020 ජනවාරි මස සිට ජුනි මස දක්වා කාලය සඳහා අයවැයක් පිළියෙළ කිරීම සඳහා සංගක්කාර මහතා ඔබගේ සහය ඉල්ලා ඇතැයි සිතන්න. පහත අතිරේක තොරතුරුද ඔබ වෙත සපයා ඇත.

i. 2020 ජනවාරි මාසය තුලදී රු. 450,000 ක් වටිනා ලී බඩු උපකරණ මිලදී ගැනීමට යෝජිතය.

ii. ව්‍යාපාරයේ අපේක්ෂිත විකුණුම් ප්‍රමාණය පළමු මාස තුන සඳහා මසකට රු. 400,000 බැගින්ද ඉන්පසු මසකට රු. 200,000 ක් බැගින් ද වශයෙන් ඇස්තමේන්තුගත කර ඇත.

iii. ව්‍යාපාරයේ අපේක්ෂිත ගැණුම් පළමු මාස තුන සඳහා රු. 300,000 බැගින් ද ඉන්පසු මසකට රු. 170,000 බැගින් ද ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

iv. 2020 පළමු මාස හය සඳහා ඇස්තමේන්තුගත වියදම් පහත පරිදිය.

- 2020 පෙබරවාරි මාසය තුලදී රු. 80,000 ක අලෙවි ප්‍රවර්ධන වියදමක් දැරීමට නියමිතය.
- සෑම මසකම අවසානයේදී රු. 50,000 ක පොදු වියදමක් දැරිය යුතු වේ.
- වැටුප් සහ වේතන සෑම මසකම අවසාන දිනයේදී ගෙවිය යුතු වන අතර ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත වැටුප් සහ වේතන පළමු මාස තුන සඳහා රු. 140,000 ක්ද ඉන්පසු එළඹෙන කාලය තුලදී මසකට රු. 210,000 බැගින්ද වේ.

- 2020 ජනවාරි මාසය සඳහා වන කඩ කුලිය රු. 80,000 ක් වේ. කුලී ගිවසුමට අනුව පළමු මාස හතර තුළ මෙම කඩ කුලිය සෑම මසකම 10% බැගින් වැඩිවිය යුතුය.

v. මුළු විකුණුම් වලින් 80% ක් ණයට විකුණුම් වන අතර ඉතිරිය අත්පිට විකුණුම් වේ. ණයගැතියන් විසින් සිය ණය මුදලින් 60% ක් විකුණුම් සිදුවූ මාසයට පසු මාසයේත් ඉතිරි 40% දෙවන මාසයේදීත් ගෙවිය යුතු වේ.

vi. සමස්ත ගැණුම් ප්‍රමාණයම ණයට සිදු වන අතර ඒ සඳහා ගෙවීම් කිරීම සඳහා සැපයුම්කරුවන් විසින් ලබා දී ඇති ණය කාලය මාස එකකි.

vii. ව්‍යාපාරය මුළු විකුණුම් මත 25% ක දළ ලාභ ආන්තිකයක් පවත්වා ගනී.

**ඔබ විසින්**:

2020 ජනවාරි මස සිට මාස හයක් සඳහා මුදල් අයවැය පිළියෙළ කරන්න.

**(මුළු ලකුණු 15)**

**ප්‍රශ්ණ අංකා 03.**

(අ). 2019 ජනවාරි 01 වන දින සිල්වා මහතා විසින් තම ව්‍යාපාරය ආරම්භ කරන ලදී. 2019 ජනවාරි 31 දිනෙන් අවසන් මාසය සඳහා වන ගණුදෙනු පහත දැක්වේ.

| දිනය | ගණුදෙනුව |
|---|---|
| 01.01.2019 | සිල්වා විසින් රු. 4,000,000 ක් මුදලින්ද රු. 500,000 ක් වටිනා මෝටර් රථයක්ද සහ රු. 200,000 ක් වටිනා ලී බඩුද යොදවා සිය නව ව්‍යාපාරය ආරම්භ කරන ලදී. |
| 03.01.2019 | රු. 2,000,000 යොදමින් ව්‍යාපාරය සඳහා ජංගම ගිණුමක් විවෘත කිරීම. |
| 07.01.2019 | සුසිරි ග්‍රොසරි වෙතින් රු.500,000 ක භාණ්ඩ ණයට ගැනීම. |
| 09.01.2019 | රු. 700,000 ක භාණ්ඩ අත්පිට මුදලට මිලට ගැනීම. |
| 10.01.2019 | රු. 125,000 ක වැටුප් මුදලින් ගෙවීම. |
| 11.01.2019 | රු . 16,000 කඩකුලි ගෙවීම සඳහා චෙක්පතක් නිකුත් කිරීම. |
| 14.01.2019 | රු. 35,000 ක් වටිනා භාණ්ඩ රු. 42,000 කට අත්පිට මුදලට විකිණීම. |
| 15.01.2019 | රු. 300,000 වටිනා උපකරණ මිළට ගෙන චෙක්පතක් නිකුත් කිරීම. |
| 17.01.2019 | රු. 90,000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු. 116,000 කට සමන්ත සමාගමට ණයට විකිණීම. |
| 19.01.2019 | රු. 220,000 ක් සුසිරි ග්‍රොසරි වෙත ගෙවීම. |
| 20.01.2019 | රු. 60,000 ක් වටිනා සවිකිරීම් මිළට ගැනීම. |
| 23.01.2019 | රු. 70,000 ක් වටිනා භාණ්ඩ රු. 86,000 කට අත්පිට විකිණීම. |
| 27.01.2019 | සමන්ත සමාගම වෙතින් රු. 66,000 ක මුදලක් ලැබීම. |
| 28.01.2019 | ප්‍රචාරණ වියදම් පියවීම සඳහා රු. 25,000 චෙක්පතක් නිකුත් කිරීම. |
| 30.01.2019 | වසරේ රක්ෂණ ගාස්තු රු. 24,000 ක් වූ අතර ඉන් රු. 10,000 ක් මුදලින් ගෙවා දැමීම. |
| 31.01.2019 | අනෙකුත් අදායම් ලැබීම් රු. 25,000. |

**ඔබ විසින් :**

ඉහත දක්වා ඇති ගණුදෙනුවල බලපෑම් ගිණුම්කරණ සමීකරණය තුල දක්වන්න. මේ සඳහා පහත ගිණුම්කරණ සමීකරණය යොදා ගන්න.

ජංගම නොවන වත්කම් + ජංගම වත්කම් = ප්‍රාග්ධනය + ලාභය - ගැනිලි + ජංගම නොවන වගකීම් + ජංගම වගකීම්

**(මුළු ලකුණු 15)**

(ආ). 2019 අගෝස්තු මාසයේ පළමු සති දෙකට අදාලව තාරක පුද්ගලික සමාගමෙ සුළු මුදල් ගණුදෙනු පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| 2019 අගෝස්තු | අතැති ශේෂය | 900 |
| 2019 අගෝස්තු | ප්‍රධාන මුදල් අයකැමිගෙන් ලැබුනා | 9100 |
| 2019 අගෝස්තු | මුද්දර සහ ලියුම් කවර | 350 |
| 2019 අගෝස්තු | නිශ්කාෂණ ගාස්තු | 1000 |
| 2019 අගෝස්තු | තැපැල් ගාස්තු | 400 |
| 2019 අගෝස්තු | ප්‍රවාහන ගාස්තු | 600 |
| 2019 අගෝස්තු | ලියුම් කවර | 300 |
| 2019 අගෝස්තු | පිරිසිදු කිරීම් සේවා | 850 |
| 2019 අගෝස්තු | විදුලි පණිවිඩ | 450 |
| 2019 අගෝස්තු | ලිපිද්‍රව්‍ය | 350 |
| 2019 අගෝස්තු | ප්‍රවාහන ගාස්තු | 1100 |
| 2019 අගෝස්තු | සාගරට ගෙව්වා | 4000 |
| 2019 අගෝස්තු | ලිපිද්‍රව්‍ය | 580 |
| 2019 අගෝස්තු | අමරට ගෙව්වා | 420 |
| 2019 අගෝස්තු | පෑන් සහ පැන්සල් | 120 |
| 2019 අගෝස්තු | අග්‍රිමය ප්‍රතිපූරණය කළා | |

ඔබ විසින්;

ප්‍රවාහන ගාස්තු, තැපැල් ගාස්තු, ලිපිද්‍රව්‍ය, විවිධ වියදම්, සහ ලෙජර් ගිණුම් තීරු ඇතුලත්වන පරිදි සුළු මුදල් පොත පිළියෙළ කරන්න.

**(ලකුණු 05)**

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්ණ අංක 04.**

(i). පහත දැක්වෙන දෑ උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

(අ). ඍජු පිරිවැය සහ වක්‍ර පිරිවැය

(ආ). විචල්‍ය පිරිවැය සහ ස්ථාවර පිරිවැය

(ඇ). පාලනය කළහැකි පිරිවැය සහ පාලනය කල නොහැකි පිරිවැය

**(ලකුණු 06)**

(ii) සීමිත සුසිත සමාගම ජංගම දුරකථන ආවරණ නිෂ්පාදනය කරන අතර ඒවා එකක් රු. 500 බැගින් අලෙවි කරනු ලැබේ. එක් ඒකකයක විචල්‍ය නිෂ්පාදන පිරිවැය රු. 320 ක් වන අතර වසරකදී වැයවන ස්ථාවර පිරිවැය රු. 180,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

ඔබ විසින්:

(අ). ඒකකයක දායකය.

(ආ). දායක විකුණුම් අනුපාතය.

(ඇ). සමච්ඡේද ලක්ෂයය ඒකකවලින්.


(ඈ). සමච්ඡේද ලක්ෂයය රුපියල්වලින්.

(ඉ). රු. 50,000 ක ලාභයක් ඉපයීමට අවශ්‍ය විකුණුම් ප්‍රමාණය.

(ඊ). ඉහත තත්ත්වය පෙන්නුම් කිරීම සඳහා ලාභ වක්‍රය අදින්න.

**(ලකුණු 08)**

(iii). පහත රූපසටහනෙහි a සිට f දක්වා අක්ෂර නම් කරන්න.




**(ලකුණු 06)**

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්ණ අංකය 05.**

(i). මූල්‍ය ගිණුම්කරණය සහ කළමනාකරණ ගිණුම්කරණය අතර පවත්නා ප්‍රධාන වෙනස්කම් දක්වන්න.

**(ලකුණු 04)**

(ii). ප්‍රාග්ධන අයවැයකරණයේදී හඳුනාගන්නා විවිධ ව්‍යාපෘතීන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

**(ලකුණු 06)**

(iii) පහත දැක්වෙන්නේ අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර වූ ව්‍යාපෘති දෙකකට අදාළ වූ මුදල් ප්‍රවාහයන්ය.

| වසර | **A හි මුදල් ප්‍රවාහ (රු)** | **B හි මුදල් ප්‍රවාහ (රු)** |
|---|---|---|
| 0 | (500,000) | (500,000) |
| 1 | 110,000 | 130,000 |
| 2 | 225,000 | 300,000 |
| 3 | 225,000 | 140,000 |
| 4 | 175,000 | 250,000 |

ආයෝජකයාගේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 13% කි.

අ). පිළිගෙවුම් කාල ක්‍රමය අනුගමනය කළහොත් ඔබ විසින් තෝරාගනු ලබන්නේ කුමන ව්‍යාපෘතියද?

ආ). ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාත ක්‍රමය අනුව ඔබගේ තෝරාගැනීම වනුයේ කුමන ව්‍යාපෘතියද?

ඇ). ව්‍යාපෘති දෙකෙහිම ශුද්ධ වර්තමාන වටිනාකම ගණනය කොට ඔබගේ පිළිතුර විග්‍රහ කරන්න.

**(ලකුණු 10)**
**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 06.**

(i). මූල්‍ය කළමනාකරණයේ ඓතිහාසික ප්‍රවේශය සහ නූතන ප්‍රවේශය පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න.

**(ලකුණු 05)**

(ii). "මූල්‍ය තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළදී ලාභ උපරිම කිරීමේ අරමුණ, ධනය උපරිම කිරීමේ අරමුණ තරම්ම යෝග්‍ය අරමුණක් සේ නොසලකයි".
ලාභ උපරිම කිරීමේ අරමුණෙහි පවත්නා දුර්වලතා දක්වන්න.

**(ලකුණු 05)**

(iii). අයවැය ලේඛනයක් පිළියෙළ කිරීම මඟින් ව්‍යාපාරයකට අත්පත් කරගත හැකි ප්‍රයෝජන විස්තර කරන්න.

**(ලකුණු 05)**

(iv). සමච්ඡේද ලක්ෂ්‍ය විග්‍රහයේ මූලික උපකල්පනයන් දක්වන්න.

**(ලකුණු 05)**

**(මුළු ලකුණු 20)**

*********************************